# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2256/10 - 2021 නොවැම්බර් මස 29 වැනි සඳුදා - 2021.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### අතිගරු ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ආඥාව

1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනත

මුද්‍රාව

**ගෝඨාභය රාජපක්ෂ**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, ගෝඨාභය රාජපක්ෂ වන මම, 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව, මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම නිවේදනය මඟින් පහත උපලේඛනයෙහි සඳහන් වන සේවාවන් සැපයීමෙහි නිරත වන ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් සාමාන්‍ය ජනජීවිතය පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන බව සැලකිල්ලට ගනිමින් හා එම සේවාවන් සැපයීමට අවහිරයක් හෝ බාධාවන් ඇතිවීමට හැකියාවක් පැවතීම හේතුවෙන් සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කොවිඩ් - 19 රෝග නිවාරණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශයන්හි සඳහන් වන කරුණු ද අවධානයට ලක්කරමින් ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපාකාර සමිතියකින් හෝ රාජ්‍ය බැංකුවකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන පහත උපලේඛනයේ සඳහන් සේවාවන් පූර්වෝක්ත වගන්තියෙහි කාර්යයන් සඳහා අත්‍යාවශ්‍ය සේවාවන් බවට මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

වර්ෂ දෙදහස් විසිඑකක් වූ නොවැම්බර් මස 29 වැනි දින කොළඹ දී අත්සන් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.


1A - G 35467 — 370 (2021/11)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

1. 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි 3 වන වගන්තියෙන් ස්ථාපිත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඊට අදාළව ඉටු කළ යුතු වන්නා වූ හෝ අවශ්‍ය වන්නා වූ කවරවුව ස්වභාවයේ සියළුම සේවාවන්, වැඩ හෝ ශ්‍රම දායකත්වය.

2. පෙට්‍රෝලියම් නිෂ්පාදන හා ද්‍රව වායු ඇතුළු සියලුම ඉන්ධන සැපයුම හා බෙදා හැරීම.

3. රේගු ආඥාපනතේ අරමුණු සඳහා වරායක් ලෙස නිර්වචනය කර ඇති ඕනෑම වරායක් තුළ නැවකින් තෙල් හෝ ඉන්ධන බැහැර කිරීම, ප්‍රවාහනය කිරීම, ගොඩ බෑම, ගබඩා කිරීම, බාරදීම හෝ ඉවත් කිරීමට අදාළව සිදු කළ යුතු හෝ අත්‍යාවශ්‍ය වන සියලුම සේවාවන්, වැඩ හෝ ඕනෑම ආකාරයක ශ්‍රමය යෙදවීම.

4. භාණ්ඩ ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා මගී ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් සිදුකරන සියලුම පොදු ප්‍රවාහන සේවාවන්.

5. එකී පොදු සේවාවන් සේවා අවශ්‍යතාවයන් අනුව පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන්නා වූ නඩත්තුව හා ආරක්ෂක හා මෙහෙයුම් පවත්වා ගැනීම.

6. සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කෘෂි පර්යේෂණ සහකාර ඇතුලු සියළු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් විසින් ඉටු කළ යුතු වන්නා වූ හෝ ඉටු කිරීමට අවශ්‍ය වන්නා වූ කවරවුව ස්වභාවයේ සියළුම සේවාවන්, වැඩ හෝ ශ්‍රම දායකත්වය.

7. ශ්‍රී ලංකා මහබැංකුව ඇතුළුව සියළුම රාජ්‍ය බැංකු හා රක්ෂණ සේවා කටයුතු.

8. පළාත් පාලන ආයතන මගින් සිදුකරන කසළ කළමනාකරණ සේවා කටයුතු.

9. සීමාසහිත ලංකා සතොස, සමුපකාර තොග වෙළඳ සංස්ථාව, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, සමුපකාර සමිති හා වී අලෙවි මණ්ඩලය, සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම මගින් ඉටු කරනු ලබන සියළුම ආහාර, පාන ද්‍රව්‍ය ඇතුළු ජනතාවට අවශ්‍ය අනෙකුත් සියළුම පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය හෝ කළ යුතු යැයි නියමිත සියළුම සේවාවන්, වැඩ හෝ ඕනෑම ආකාරයක ශ්‍රමය යෙදවීම.

10. පළාත් සභා යටතේ වන සියළුම රජයේ කාර්යාල මගින් ඉටු කළ යුතු වන්නා වූ හෝ අවශ්‍ය වන්නා වූ කවරවුව ස්වභාවයේ සියළුම සේවාවන්, වැඩ හෝ ශ්‍රම දායකත්වය.

11. සෞඛ්‍ය සේවයට අදාළව ඉටු කළ යුතු වන්නා වූ හෝ අවශ්‍ය වන්නා වූ කවරවුව ස්වභාවයේ සියළුම සේවාවන්, වැඩ හෝ ශ්‍රම දායකත්වය.

12. තැපැල් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දේශීය හා විදේශීය ලිපි, මුද්‍රිත ද්‍රව්‍ය හා පාර්සල් භාර ගැනීම, බෙදා හැරීම සහ තොරතුරු වාර්තා කිරීම, ලියාපදිංචි ලිපි වටිනාකම ගෙවා භාරදීමේ සේවාව, දේශීය හා විදේශීය අධිවේගී තැපැල් සේවාව, ඖෂධ බෙදා හැරීමේ විශේෂ සේවාව, මුදල් හුවමාරුව ඇතුළු අනෙකුත් තැපැල් සේවාවට අදාළ කාර්යයන්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.